1. PDN
2. Welfare
[redacted]

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 55/26 — 1979 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා — 1979.09.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී—බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 15(vii) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ඩබ්. එම්. ඒ. විජේරත්න බණ්ඩා
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1979 සැප්තැම්බර් මස 28 වන දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1979 අංක 5 දරන ප්‍රවේශ කමිටු නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි අතර, 1979 ඔක්තෝබර් මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. ප්‍රවේශ කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය:—

(අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) එක් එක් විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා; සහ

(ඇ) එක් එක් විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා.

3. ප්‍රවේශ කමිටුවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

4. කොමිෂන් සභාවේ සභාපතිවරයා ප්‍රවේශ කමිටුවේ සියළුම රැස්වීම්වල මූලසුන දැරිය යුතුය. කොමිෂන් සභාවේ සභාපතිවරයාට රැස්වීමක මූලසුන දැරීමට නොහැකි වූ විට සාමාජිකයන් විසින් පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතුය.

5. කොමිෂන් සභාවේ ලේකම්වරයා ප්‍රවේශ කමිටුවේ ලේකම්වරයා විය යුතුය.

6. ප්‍රවේශ කමිටුව විසින් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය:—

(අ) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විමසා උසස් අධ්‍යාපන ආයතනයන්හි ප්‍රථම උපාධි සඳහා නියමිත අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුල් කිරීම සම්බන්ධ පහත සඳහන් කරුණු පිළිබඳව කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම:—

(i) එක් එක් අධ්‍යයන පාඨමාලාවට ඇතුල් කරගැනීම සඳහා අවශ්‍යතා;

(ii) එක් එක් අධ්‍යයන පාඨමාලාවට ඇතුල් කර ගතයුතු ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(iii) විවිධ උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුල් කරගැනීම සඳහා තෝරා ගනු ලැබූ ශිෂ්‍යයන් වෙන් කිරීමේ ක්‍රමය හෝ ක්‍රම; සහ

(iv) ඉහත සඳහන් කරුණුවලට සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ අතිකුත් කරුණු.

(ආ) කොමිෂන් සභාව විසින් ප්‍රවේශ කමිටුව වෙත යොමු කරන ලද උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි සඳහා නියමිත අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුල් කරගැනීම සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ යම් කරුණක් පිළිබඳව කොමිෂන් සභාවට උපදෙස් දීම.